විභාග අංකය:

33

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජූලි/ අගෝස්තු

ආර්ථික විද්‍යාව

# ECON 4121.03 – සංවර්ධන ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය

- කාලය පැය තුන (03) යි.
- ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් (03) සමන්විත ය. පළමුවන කොටස අනිවාර්ය වන අතර දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන **ප්‍රශ්න පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න. ප්‍රශ්න පත්‍රයේ පළමුවන කොටස ඔබගේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි විය යුතුය.

## පළමුවන කොටස

**(මෙම කොටසට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න)**

1. පහත ප්‍රශ්නවලට දී ඇති වරණයන් අතුරින් වඩාත් සුදුසු වරණය ලකුණු කරන්න.

(ලකුණු 02 බැගින් උපරිම ලකුණු 20)

i). ශ්‍රී ලංකා රජයේ ආර්ථික සංවර්ධන උපායමාර්ගයන්ට අනුව 2017 වර්ෂය හඳුනාගනු ලබන්නේ,
- අ). දිළිඳුකමින් මිදීමේ වර්ෂය වශයෙනි.
- ආ). ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කරගත් වර්ෂය වශයෙනි.
- ඉ). කලාපීය සහයෝගීතාව වර්ධනය කරගනු ලබන වර්ෂය වශයෙනි.
- ඊ). ජාත්‍යන්තරව පිළිගැනීමට ලක් වූ රටක් ගොඩනැගීමේ වර්ෂය වශයෙනි.

ii). සංවර්ධන ප්‍රතිපත්ති විශ්ලේෂණයන්ට අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතා ප්‍රවණතාවන්ගේ දැකගත **නොහැකි ලක්ෂණය** වන්නේ,
- අ). සාපේක්ෂව ඉහළ ජීවන තත්ත්වයක් සහතික නොවීම
- ආ). ඒක පුද්ගල ආදායම අවම වීම
- ඉ). ආකල්පමය වශයෙන් ගොඩනැගුණු දරිද්‍රතාවක් පැවතීම
- ඊ). දුගී බව සමඟ බැඳුණු ආවේණික සංස්කෘතියක් උරුම වීම

iii). අඩු සංවර්ධනයක් සහිත රටක සංවර්ධන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු විශේෂ ලක්ෂණයක් වන්නේ,
- අ). සංවර්ධන ප්‍රතිපත්ති කාලානුරූපව වෙනස් විය යුතු වීම
- ආ). සංවර්ධන ප්‍රතිපත්තිවල අරමුණු පාලනයේ රැඳී සිටින දේශපාලන චින්තනය සමඟ බැඳී පැවතීම
- ඉ). සංවර්ධන ප්‍රතිපත්ති සමඟ බැඳුණු න්‍යායික රාමුවක් ක්‍රියාත්මක වන බව
- ඊ). දිගුකාලීන ආර්ථික සැලසුම් සඳහා සංවර්ධන ප්‍රතිපත්ති හා අරමුණු පාදක වීම

iv). සංවර්ධන ක්‍රියාවලියක් වේගවත්ව ඉදිරියට යාම සඳහා සෘජු විදේශ ආයෝජනවල අවශ්‍යතාව සඳහන්ව ඇත්තේ මින් කුමන ප්‍රකාශයෙහි ද?
- අ). සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍යවන මූලික අරමුදල් සම්පාදනයේ ආයෝජන මූලාශ්‍රයක් වශයෙන් විදේශ ආයෝජන භාවිත කළ හැකි ය.
- ආ). දේශීය ඉතුරුම් හා ආයෝජන අතර පවත්නා හිඟය පියවීම සඳහා මූල්‍යයන උපායමාර්ගයක් වශයෙන් විදේශ ආයෝජන යොදා ගත හැකි ය.
- ඉ). රටක ඉතුරුම් ආයෝජන අවශ්‍යතාවන්ට ප්‍රමාණවත් නොවන විට මෙන්ම බාහිරව ලබාගන්නා අඩු කාර්යසාධනයන් ද විදේශ ආයෝජනයන් දිරිමත් කරනු ලබයි.
- ඊ). දේශීය තාක්ෂණය, සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රවේගකාරීත්වය සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක විදේශීය වශයෙන් තාක්ෂණික ආධාර ලබා ගත යුතු වේ.

v). දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය සංවර්ධන ප්‍රතිපත්ති අධ්‍යයනයේ දී වැදගත් වන්නේ ඇයි?
- අ). දියුණුවෙමින් පවතින රටවල පැවති ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීම සඳහා නව ප්‍රතිපත්ති ඉදිරිපත් වූ කාලසීමාව වීම
- ආ). රටවල් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීම
- ඉ). යටත් විජිත වශයෙන් පැවති රටවල් එයින් නිදහස ලබාගැනීම
- ඊ). ඉහත සියලුම හේතු

vi). යටත් විජිත ආර්ථික ප්‍රතිපත්තිවල පැවති අවාසියක් **නොවන්නේ,**

අ). ස්වභාවික සම්පත් සූරාකෑමට යුරෝපීය රටවල් කටයුතු කිරීම

ආ). අඩු දියුණු රටවල මිනිස් ශ්‍රමය අවභාවිත කිරීම

ඉ). රටවල වෙළෙඳපොළ පුළුල් කරගැනීමට හැකිවීම

ඊ). තාක්ෂණික ක්‍රමවේදයන්ගේ මාරුවීමක් සිදුවීම

vii). පහත ප්‍රකාශයන් අතුරින් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

අ). අඩු දියුණු රටවල් කාර්මිකකරණයට ළඟාවීමේ එක් උපායමාර්ගයක් වශයෙන් ආනයන ආදේශන කාර්මිකකරණ ප්‍රතිපත්ති හඳුනාගනු ලබයි.

ආ). ඕනෑම රටකට ආනයන ආදේශන කාර්මිකකරණ ප්‍රතිපත්ති මගින් විදේශීය පරායත්තතාව අවම කරගැනීමට හැකියාවක් පැවතුනි.

ඉ). ආනයන ආදේශන කාර්මිකකරණය ක්‍රියාත්මක වූ රටවල ඊට එරෙහිව තීරු බදු ප්‍රතිපත්තිය ද ක්‍රියාත්මක විය.

ඊ). ආනයන ආදේශනයට සාපේක්ෂව අපනයන ප්‍රවර්ධනය ඉහළ කාර්යක්ෂමතාවක් සහිත ආර්ථික ප්‍රතිපත්තියකි.

viii). අපනයන ප්‍රවර්ධන කාර්මිකකරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔබ හඳුනාගනු ලබන විශේෂත්වයක් **නොවන්නේ,**

අ). අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්ති වෙළෙඳපොළ ප්‍රමුඛකරගත් උපායමාර්ගයක් වීම

ආ). පාරිභෝගික සුබසාධනය ඉහළ ආර්ථික ප්‍රතිපත්තියක් වීම

ඉ). ඉහළ පරිපාලන වියදම් සහිත ආර්ථික ප්‍රතිපත්තියක් වීම

ඊ). නිදහස් ව්‍යාපාරික පන්තියක් බිහිවීම සඳහා පදනමක් සැපයීම

ix). ආර්ථික සැලසුම්කරණයක් නොමැතිවිට මූලික ආර්ථික ප්‍රශ්න විසඳනු ලබන්නේ,

අ). මිල යාන්ත්‍රණය මගිනි

ආ). වෙළෙඳපොළ හා රජය ඒකාබද්ධව ගනු ලබන තීරණ මගිනි

ඉ). ආයෝජන අවස්ථාවන් හි කාර්යසාධනය අනුව ය

ඊ). පෞද්ගලික අංශයේ පූර්ණ මැදිහත්වීම මගිනි

x). සංවර්ධනය වන රටවල සැලසුම්කරණයේ දී දිගුකාලීන සැලසුම් වැදගත් වේ. එයට හේතුවක් **නොවන්නේ,**

අ). එම රටවල පවත්නා ජනගහන වර්ධනයේ හා ආර්ථික වර්ධනයේ අසමබරතාව තුලනය කිරීම

ආ). එම රටවල ජීවන මට්ටම දිගුකාලීනව වර්ධනය කිරීමට

ඉ). එකම කණ්ඩායමක් විසින් දීර්ඝ කාලයක් පාලනයේ රැඳී සිටීම

ඊ). කෙටිකාලීනව සම්පූර්ණ කරගත යුතු ඉලක්ක දිගුකාලීන සැලසුමකට අනුව සංවිධානය විය යුතු වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජූලි/ අගෝස්තු

ආර්ථික විද්‍යාව

## ECON 4121.03 – සංවර්ධන ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය

- කාලය පැය තුන (03) යි.
- ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් (03) සමන්විත ය. පළමුවන කොටස අනිවාර්ය වන අතර දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. ප්‍රශ්න පත්‍රයේ පළමුවන කොටස ඔබගේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි විය යුතුය.

### දෙවන කොටස

2. i). යටත් විජිත ආර්ථික ප්‍රතිපත්තිවල වාසි වශයෙන් ඔබ හඳුනාගන්නේ මොනවාද? (ලකුණු 04)

   ii). 'යටත් විජිතවාදයේ ඍණ බලපෑමක් අඩු දියුණු රටවල් සම්බන්ධයෙන් දැකගත හැකි ය' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 06)

   iii). යටත් විජිත කාර්මිකකරණ උපායමාර්ගවල සාධනීය හා නිශේධනීය අවස්ථාවන් උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 05)

3. i). සංවර්ධන ප්‍රතිපත්තියක් ලෙස ආනයන ආදේශන කාර්මිකකරණ ප්‍රතිපත්ති අසාර්ථකවීමට බලපෑ හේතු මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

   ii). අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්ති සංවර්ධන ප්‍රතිපත්තියක් ලෙස සාර්ථක ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගනු ලබන්නේ කුමන හේතු නිසා ද? (ලකුණු 05)

   iii). ආර්ථික ප්‍රතිපත්තියක් වශයෙන් අපනයන ප්‍රවර්ධනයේ හා ආනයන ආදේශනයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය ලංකා ආර්ථිකය ඇසුරින් විභාග කරන්න. (ලකුණු 05)

4. i). දියුණුවන රටවල් සම්බන්ධයෙන් විදේශ ආධාර හා ආයෝජනවල අවශ්‍යතාව න්‍යායාත්මකව විමසන්න. (ලකුණු 04)

   ii). සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පරිසරයට වන හානිය පිළිබඳ සැලකිලිමත් විය යුත්තේ ඇයි? හේතු දක්වන්න. (ලකුණු 06)

   iii). අඩු දියුණු රටවල් සංවර්ධනය කිරීමේ දී සුදුසු ජනගහන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම වැදගත් වන බවට ඉදිරිපත් කරන තර්කයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

### තෙවන කොටස

5. i). සංවර්ධන සැලසුම් සම්පාදනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 04)

   ii). 'අඩු දියුණු රටවල් සම්බන්ධයෙන් සැලකුවිට මූල්‍යමය සැලසුම් අසාර්ථක වීමක් සිදු විය හැකි ය' එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iii). විවිධ සැලසුම් සම්පාදන ක්‍රම ශිල්ප දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

6. i). නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන සැලසුම් සම්බන්ධයෙන් හඳුනාගන්නා විශේෂ කාලසීමාවන් හා ඒවාට අදාළ විශේෂතාවන් දක්වන්න. (ලකුණු 04)

ii). 1977 වර්ෂය ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම්වල වැදගත් වෙනසක් සිදුවූ වර්ෂයක් ලෙස සලකනු ලබයි. හේතු දක්වන්න. (ලකුණු 05)

iii). සිවිල් යුද්ධයෙන් පසුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ සංවර්ධන සැලසුම් සම්බන්ධයෙන් ඔබ හඳුනාගනු ලබන සාධනීය හා නිශේධනීය ලක්ෂණ මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

7. i). 'ඉන්දියානු ආර්ථික සංවර්ධන සැලසුම් දිගුකාලීන අරමුණු ඉලක්ක කරගත් සැලසුම් වශයෙන් හඳුනාගැනීම සාධාරණ වේ' හේතු දක්වමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii). ඉන්දියානු ආර්ථික සැලසුම්කරණයේ ප්‍රධාන අරමුණු මොනවාද? (ලකුණු 04)

iii). ආර්ථික සංවර්ධන සැලසුම් පිළිබඳ අධ්‍යයනයේ දී ඉන්දියානු සැලසුම්කරණය ආකෘතියක් වශයෙන් යොදාගැනීමේ හැකියාව විවේචනාත්මකව විමසන්න. (ලකුණු 06)

***********